**කහවත්ත ප්‍රාදේශීය සභාව - 2021**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කහවත්ත ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කහවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.1 (ඇ) ඡේදය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාලව බිල්කල යුතු ව්‍යාපාර හා කර්මාන්ත බදු ශේෂය රු. 536,850 ක් වුවත්, මුදලින් ලද රු. 396,700 ක මුදල බිල්කිරීම් වශයෙන් දැක්වීම හේතුවෙන් මෙහෙයුම් අතිරික්තය රු. 140,150 ක් අඩුවෙන් දක්වා තිබුණි. | රටතුල පැවති කොවිඩ් වෛරස තත්ත්වය හේතුවෙන් ව්‍යාපාර ස්ථාන බොහෝමයක් වසා දමා තිබූ බැවින් අදාල වර්ෂයට බිල් කිරීමේදී සත්‍ය ලෙසම ලැබුණු ආදායම බිල් කිරීම ලෙස දක්වන ලදී. 2022 වර්ෂයේ සිට මෙම අඩුපාඩුව නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | උපචිත පදනම මත ගිණුම් තැබිය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ පරිගණක මුද්‍රණ යන්ත්‍ර 05 ක් වෙනුවෙන් දැරූ රු. 84,500 ක මුදල වත්කම් ගිණුමට දෙවරක් සටහන් කර තිබුණි. | 2022 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් මිලදී ගැනීම් වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී මුදලින් ලද රු. 317,940 ක දැන්වීම් පුවරු ගාස්තුව හා රු. 52,000 ක් වූ පරිසර බලපත්‍ර ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයට අදාළව ලැබී ඇති ගාස්තු වර්ෂයට අදාළව ගිණුම්ගත කර ඇති බව. | උපචිත පදනම මත ආදායම් ගිණුම් තැබිය යුතුය. |
| (ඈ) | පසුගිය වසරේ විගණකාධිපති වාර්තාවේ 1.2 හි (අ), (ආ) සහ (ඇ) යටතේ පෙන්වා දී තිබූ ගිණුම්කරණ අඩුපාඩු 04 ක් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කළ යුතුය. |

**1.6.2 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගිණුම් විෂයයන් 03 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 388,335 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2021 දෙසැම්බර් 31 දින දක්වා පොළිය උපකල්පනය කර ගණනය කර ඇති බැවින් මූල්‍ය ප්‍රකාශ අනුව රු. 2,589,825 ක ශේෂයක් පෙන්වන බව හා ගෙවා ඇති රු. 194,688 ක වාරිකය එම ආයතනය විසින් හිඟ වාරික ලෙස සඳහන් කිරිම හේතුවෙන් වෙනසක් පෙන්වන බව. | මූල්‍ය ප්‍රකාශන තුල දක්වා ඇති ශේෂයන් උපලේඛන සමඟ සැසඳිය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,861,704 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,016,690 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට රජයේ ආයතන 17 ක රු. 96,501 ක හිඟ ශේෂයක් හා පෞද්ගලික ඒකක 450 කින් රු. 1,006,409 ක් වශයෙන් වරිපනම් ඒකක 467 කට අදාලව රු. 1,102,910 ක හිඟයක් පැවතුණු අතර, එම හිඟ ශේෂ අයකර ගැනීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි. | ජනතාවගේ ආදායම් මාර්ග බිඳ වැටීම පිළිබඳ සැලකිල්ලට ගෙන හිඟ ආදායම් අයකර ගැනීමේ කටයුතු ක්‍රියාත්මක නොකිරීම සුදුසු බවට සභාව විසින් ඒකමතිකව තීරණය කර තිබුණද, වර්තමානයේදී ජංගම සේවා පවත්වා හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) දැන්වීම් පුවරු ගාස්තු** | | |
| සභාව විසින් 2021 වර්ෂය සඳහා දැන්වීම් පුවරු සමීක්ෂණයක් සිදුකර ආයතන 28 කට අදාලව | අවසාන නිවේදන නිකුත් කර ඇති බවත්, කොවිඩ් වෛරස තත්ත්වය හේතුවෙන් සංවරණ | ආදායම් කාලීනව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දැන්වීම් පුවරු 28 ක් හඳුනාගෙන ඇති අතර, ඉන් ආයතන 08 කට අදාලව රු. 238,232 ක් 2020 වර්ෂයේ සිට හිඟව පවතින අතර, හිඟ ආදායම් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | සීමා පනවා තිබීම, නිලධාරීන්ගේ පැමිණීම සීමා කර තිබීම ආදි කරුණු හේතුවෙන් අදාල මුදල් අයකර ගැනීමට නොහැකි වී ඇති බව. | |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**------------------------------**

| | විගණන නිරීක්ෂණය<br>----------------------- | සභාවේ අදහස් දැක්වීම<br>------------------------ | නිර්දේශය<br>------------- |
|---|---|---|---|
| (අ) | සභාව සතුව ඇති බැකෝ යන්ත්‍රය සභාපතිතුමාගේ නිර්දේශය මත අවිධිමත් ලෙස කුලී පදනම මත විවිධ පාර්ශවයන්ට ලබාදීම සිදුකරනු ලබන අතර, යන්ත්‍ර පැය 139.5 ක් අවස්ථා 23 කදී සභාවේ මන්ත්‍රීන් වෙත විවිධ කාර්යයන් සඳහා සභා තීරණයක් ලබා ගැනීමකින් තොරව ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී බැකෝ යන්ත්‍රය පුද්ගලයින් 06 දෙනෙකු වෙත කුලී පදනම මත ලබාදී යන්ත්‍ර පැය 25 ක් වෙනුවෙන් පැයකට රු. 2,500 බැගින් රු. 62,500 ක ආදායමක් ලැබී තිබූ අතර, සමාලෝචිත වර්ෂය තුලදී බැකෝ යන්ත්‍ර ක්‍රියාකරුට වැටුප් හා දීමනා වශයෙන් රු. 573,543 ක්ද, ඉන්ධන වියදම රු. 262,213 ක් සහ අළුත්වැඩියා වියදම රු. 129,875 ක් වශයෙන් එකතුව රු. 392,088 ක්ද දරා තිබුණි. ඒ අනුව සභාව සතු දේපල ඵලදායීව යොදවා නොමැති බව නිරීක්ෂණය විය. | බැකෝ යන්ත්‍රය පොදු කටයුතු සඳහා ලබාදීමේදී ජනතාවගේ ඉල්ලීම අනුව කොට්ඨාස මන්ත්‍රීවරයා හරහා ගරු සභාපති තුමා විසින් ලබාදීම සිදු කරනු ලබන බවත්, අමතර කොටස් ගෙවී ගොස් ඇති නිසා රථය සඳහා පෙරට වඩා වියදමක් දැරීමට සභාවට සිදු වී ඇති බවත්, රියදුරා බැකෝ රථයට අමතරව ට්‍රැක්ටර රථ ධාවනය කිරීමද සිදු කරනු ලබන බව. | වත්කම් කුලී පදනම මත ලබාදීමේදී විධිමත් ක්‍රමවේදයක් යටතේ ලබාදිය යුතුය. |
| (ආ) | කහවත්ත ප්‍රාදේශීය සභාව ස්ථාපනය කිරීමට පෙර අටකලන්පන්න ප්‍රාදේශීය | පර්චස් 22 ක ඉඩම් කොටසක් 1995 වර්ෂයේදී කහවත්ත ප්‍රාදේශීය සභාව විසින් බදු | හිඟ නිවාස කුලී අයකර අනවසර පදිංචිකරුවන් ඉවත් කර දේපල පවරා |

| | | |
|---|---|---|
| සභාවට අයත්ව තිබූ ඇන්දාන නවනගරයේ පෙට්‍රල් ගබඩාව සඳහා ඉදිකරන ලද ගොඩනැගිල්ල 1995 මැයි 24 දින පුද්ගලයෙකුට බදු දී ඇති අතර, බදුකරුවන් විසින් 2019 ජූලි 24 දින ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාව මගින් මෙම ගොඩනැගිල්ල සහිත ඉඩමට ඔප්පුවක් ලබාගෙන ඇති බැවින් මෙම දේපල සභාවට අහිමිවීමේ අවධානමක් පවතින බව නිරීක්ෂණය විය. තවද, මෙම බදුකරුවන් විසින් 2019 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2022 මාර්තු වනවිටත් අදාළ නිවාස කුලී හා ප්‍රමාද ගාස්තු ලෙස රු. 112,100 ක් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතුව තිබුණි. | ගිවිසුමක් මගින් ලබා දී ඇත. බදුකරු විසින් 2018 වන තෙක් බදු මුදල් ගෙවීම් කටයුතු සිදුකර ඇති අතර එතැන් සිට බදු මුදල් ගෙවීමේ කටයුතු පැහැරහැර ඇත. ඉඩම් 2019 ජූලි 24 දින විකුණුම්කරයක් මගින් අයථා අන්දමින් ලබාගෙන ඇති බැවින් එම පුද්ගලයින්ට එරෙහිව පැල්මඩුල්ල දිසා අධිකරණයේ නඩුවක් ගොනු කර ඇති බව. | ගැනීමට කටයුතු කළ යුතුය. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**------------------------------------------**

**පාරිසරික ගැටලු**

**------------------**

| විගණන නිරීක්ෂණය<br>------------------------ | සභාවේ අදහස් දැක්වීම<br>----------------------- | නිර්දේශය<br>--------------- |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ සමාලෝචිත වර්ෂයේදී ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සැලැස්මක් පිළියෙල කර තිබුණද, ඒ අනුව කටයුතු කළ බවට අනාවරණය නොවූ අතර, කසළ මෙට්‍රික් ටොන් 855.5 ක් පමණ බැහැර කිරීම සඳහා රු. 3,537,624 ක පිරිවැයක්ද, කාර්යය මණ්ඩල සේවකයින් 15 දෙනෙකුද, වාහන සහ යන්ත්‍ර උපකරණ 06 ක්ද යොදවා තිබුණි. එසේ වුවද, එම අපද්‍රව්‍ය බැහැර කිරීම විධිමත්ව හා පරිසර හිතකාමී ක්‍රමවේදයකින් තොරව භූමියේ වලවල් හාරා ඒ තුළ අපද්‍රව්‍ය බැහැර කර වලවල් වසා දැමීම මගින් පාරිසරික ගැටළු රාශියක් මතුවී තිබුණි. | 2003 වර්ෂයේ සිට විවෘත කසළ බැහැර කිරීමක් සිදු කරනු ලබන බවත්, කසළ බැහැර කරනු ලබන ඉඩම ප්‍රාදේශිය සභාව වෙත පවරා ගැනීමේ කටයුතු කඩිනම් කරමින් පවතින අතර කසළ ප්‍රතිචක්‍රීයකරණ වැඩසටහන ආරම්භ කිරීමෙන් පසු මෙම භූමිය වෙත බැහැර කරනු ලබන කසළ ප්‍රමාණය ක්‍රමයෙන් අඩු කිරීමට සැලසුම් සකස් කරමින් පවතින බව. | අපද්‍රව්‍ය පාරිසරික හානි අවම වන අයුරින් බැහැරලීමට කටයුතු කළ යුතුය. |